**වැලිකන්ද ප්‍රාදේශීය සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වැලිකන්ද ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට වැලිකන්ද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

-------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) උතුරු මැද පළාත් පාලන කොමසාරිස් විසින් 2019 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද අංක 2019/02 චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නව ගිණුම්කරණ ක්‍රමයට අනුව ඉදිරිපත් කර ඇති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i) ඇ (iii) උප වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂය සමඟ සැසඳිය නොහැක.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)iv වගත්තියේ සඳහන් අවශ්‍යතාව අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---

**1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

---

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් දේපළ පිරියත සහ උපකරණ ක්ෂය ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි. | හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය ගිණුම්ගත කර ඇති අතර එය ඉදිරියේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ සටහන් කරන බව දන්වා ඇත. | භාවිතා කල ක්ෂය ක්‍රමය හා ක්ෂය අනුපාත මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතු වේ. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

---

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භෞතිකව දක්නට නොතිබූ ගොඩනැගිලි අයිතම 03 ක ශුද්ධ වටිනාකම රු.665,076 ක් පොත් වලින් කපාහැරීමට කටයුතු නොකර ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | වත්කම් භෞතිකව නොමැති නිසා පොත් වලින් කපා හැරිමට අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | ගොඩනැගිලි වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මිළදීගත් රු.155,470 ක් වටිනාකම වූ වත්කම් අයිතම 04 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේ දී මෙම වටිනාකම පොත් වලට ඇතුළත් කිරීමට කටයුතු කරමි. | දේපල පිරියත උපකරණ වටිනාකම හා ක්ෂය වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | LDSP ව්‍යාපෘතිය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලද මුදලින් සමාලෝචිත වර්ෂය තුල දරන ලද රු.1,334,906 ක ප්‍රාග්ධන වියදම් දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත නොකර පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිකිරීම් කටයුතු අවසන් වී නොමැති හෙයින් ඉදිරියේ දී මෙම වත්කම දේපළ පිරියත උපකරණ යටතේ ඇතුළත් කරනු ලබයි. | ප්‍රාග්ධන ප්‍රදාන වලින් දරන ලද වියදම් පුනරාවර්තන වියදම් ලෙස නොසලකා ප්‍රාග්ධනිත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.3,460,000 ක් ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනයේ අතිරික්තයේ /ඌනතාවයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන යටතේ දැක්විය යුතු වුවත් එය ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂයේ විස්තීරණ ආදායම තුල ඇතුලත් කර තිබුණු අතර වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ අතිරික්තයේ /ඌනතාවයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන යටතේ දක්වා නොතිබුණි. | මෙම ප්‍රාග්ධන ප්‍රදාන වර්ෂය තුළ ලද ප්‍රාග්ධන ප්‍රදාන ලෙස හඳුනාගෙන ඇති අතර එය වර්ෂයට අදාළ වන හෙයින් විස්තීර්ණ ආදායම් තුළ පෙන්නුම් කර ඇත. | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය තුළ ප්‍රාග්ධන ප්‍රදාන අතිරික්තයේ හෝ ඌණතාවයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන යටතේ දැක්විය යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම රු.24,605,356 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.38,965,922 ක් ලෙස රු.14,360,566 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි මුදල් ශේෂය ගිණුම් ගත කළ යුතු වේ. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ අයභාරය රු.882,185 ක් වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,123,800 ක් විය.

**2.2** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

------------------------------------

**(අ)** **බලපත්‍ර ගාස්තු**

----------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු 04 ක් සඳහා දැන්වීම් පුවරුවේ සත්‍ය වර්ග අඩි ප්‍රමාණයට ගාස්තු අයවී නොතිබුණු අතර, එහි හිඟය රු. 166,250 ක් විය. | ඉදිරියේ දි නිවැරදි කර ගනිමි. හිඟ මුදල් අය කර ගැනිමට කටයුතු කරමි. | දැන්වීම් පුවරු සමීක්ෂණය කර ඒවායේ සත්‍ය වර්ග අඩි ප්‍රමාණයට ගාස්තු අය කළ යුතුවේ. |

**(ආ)** **කුලී**

------

| | | |
|---|---|---|
| තක්සේරු දෙපාර්තමේන්තුවේ මාසික කුලී තක්සේරුව අනුව කඩකාමර කුලී මුදල් අයනොකිරීම හේතුවෙන් සෙවනපිටිය දෙවන හා තෙවන | තක්සේරු කර ඇති මාසික කුලී මුදල සම්බන්ධයෙන් ඇතිවී ඇති ගැටළු සහගත තත්වය හේතුවෙන් නැවත තක්සේරු කිරීම සඳහා ඉල්ලීම් කර ඇත. | තක්සේරු කුලිය අය කිරීමට කටයුතු කළයුතු වේ. |

අදියර කඩ කාමර 16 කට අදාලව සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 31 දින වන විට සභාවට රු. 455,000 ක පාඩුවක් සිදු වී තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගීතා සේවා හා පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත්කිරිම හා පාලනය කිරිම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරිම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට හිඟ කුලී පවතින සෙවනපිටිය කඩකාමර 12 ක් කිසිදු ව්‍යාපාර කටයුත්තක් සිදු නොකර නිෂ්කාර්යව පැවතුණි. | ගිවිසුම් යාවත්කාලීන කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතියි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ වාර්ෂිකව ජනනය වන ටොන් 312 ක් පමණ වූ කසල ප්‍රමාණයක් 2020 වර්ෂයේ රු.5,000,181 ක වියදමක් දරා සභාව සතු ඇතුගල පිහිටි අපහරණ භූමිය වෙත බැහැර කර තිබුණද, දිරන කසල භාවිතා කර කාබනික පොහොර නිෂ්පාදනය කිරිම සඳහා ක්‍රමවත් ඝන අපද්‍රව්‍ය කළමණාකරණ වැඩසටහනක් කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | කසල ප්‍රවාහනය සඳහා අවශ්‍ය කම්පැක්ටැර් රථයක් අප සතුව නැත. 2020 සංවර්ධන සැලැස්ම වැඩ සටහන යටතේ නොදිරන කසල අලෙවි කිරිමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇති අතර එය ක්‍රියාත්මක වුවහොත් මෙම ගැටළුව නිරාකරණය කර ගත හැක. | ක්‍රමවත් ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ වැඩපිළිවෙලක් සකස් කර ගත යුතුවේ. |